(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 1(3)]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2008 ජුලි මස 25 වැනි සිකුරාදා**

## 2008 අගෝස්තු මස 05 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 118,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් එක්දහස් එකසිය අසූපන් කෝටි හතලිස් ලක්ෂයකට (රු.1,185,40,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 118 | — | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 03 | — | කෘෂිකාර්මික සංවර්ධනය |
| පුනරාවර්තන වියදම් | | | රු. 1,185,40,00,000 |
| මුළු වියදම | | | රු. 1,185,40,00,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජුලි මස 25 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 05 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 4 දක්වා එකතුව රුපියල් 3,216,180,332.

*

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජුනි මස 27 වැනි දින අංක 1555/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— කැලෑ ආඥා පනත යටතේ නියෝග,— කැලෑ ආඥා පනතේ (451 වැනි අධිකාරය වූ) 24 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 මැයි 09 වැනි දින අංක 1548/29 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.22 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය,— 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 25 වැනි දින අංක 1533/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ සහ 23 ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 01 වැනි දින අංක 1534/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## 2008 සැප්තැම්බර් මස 09 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0722/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සහ ඊට මායිම්ව දැනට තිබෙන විදුලිබලය උත්පාදනය කරන රජයේ සහ පෞද්ගලික විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද ;

(ii) එම එක් එක් විදුලි බලාගාරය මගින් වාර්ෂිකව නිපදවන විදුලි ඒකක ප්‍රමාණය කොපමණද ;

(iii) මෙම එක් එක් බලාගාරය ඉදිකිරීමේ දී ජලාශ හා අනෙකුත් ඉදිකිරීම් වෙනුවෙන් වෙන්කර ඇති භූමි ප්‍රමාණය සහ ඉවත්කළ පවුල් සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ විදුලිබලය නොමැති ග්‍රාමනිලධාරී වසම් සංඛ්‍යාව සහ විදුලිය නොලැබූ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් ව කොපමණද;

(ii) එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අඩු වෝල්ටීයතාවයෙන් යුත් විදුලිය සහිත ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව සහ අදාළ පවුල් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ඉහත විදුලිය නොමැති හා අඩු වෝල්ටීයතාවය සහිත ප්‍රදේශවල අවශ්‍යතා සපුරාලීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට කටයුතුකර ඇති චීන ආධාර ඇතුළු "සීඩා" ව්‍යාපෘතිය හා වෙනත් විදුලි ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙන්කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0723/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරී තනතුරෙහි සිටිමින් ගුරු වෘත්තියෙහි ද යෙදෙන සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ වැටුප් ගෙවීම සඳහා සමෘද්ධි ව්‍යාපාරය මගින් මාසිකව යොදවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එකී සමෘද්ධි ගුරුවරුන්ට පත්වීම් ලබාදීමේ දී අදාළ කරගත් අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) බඳවා ගන්නා අවස්ථාවේ දී එක් එක් සමෘද්ධි ගුරුවරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) ඔවුන් තවදුරටත් අදාළ තනතුරෙහි සේවයෙහි යොදවන්නේද;

(iv) නොඑසේනම් අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත කරන්නේද; සහ

(v) මොවුන්ගේ ගුරු වෘත්තිය සංවර්ධනය කිරීම සඳහා ගෙන තිබෙන සහ ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0724/'08

ගරු එන්.ඩී.එන්.පී. ජයසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් රු. 1000/-, රු. 500/-, රු. 300/- සහ රු. 140/- දීමනා ලබන සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොපමණද;

(iii) ඒ අනුව, සමෘද්ධි ප්‍රතිලාභීන්ට ගෙවන මුලු මුදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කයේ සමෘද්ධි ව්‍යාපාරය තුළ සේවයේ නියුතු සමෘද්ධි කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන් සහ වෙනත් තනතුරු දරන අය වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(ii) ඔවුනට ගෙවන මාසික වැටුප් හා දීමනා සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒවායේ එකතුව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති සමෘද්ධි බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් සමෘද්ධි බැංකුවේ ගිණුම්වල ඉතිරි කිරීම් ප්‍රමාණය සහ ප්‍රතිලාභීන් සඳහා ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(iii) අදාළ ණය ලාභීන් සහ නොගෙවා ඇති ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0147/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තු 2008 සඳහන් පරිදි) මගින්, නගර තිරසාර බවට පත් කිරීමට නාගරික ප්‍රජාව සඳහා පහසුකම් සැපයීම යටතේ රුපියල් මිලියන 1489 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0148/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂයේ අයවැය මගින්, සුනාමියෙන් විපතටපත් ප්‍රදේශවල ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 1712ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවල ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0149/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තු 2008 සඳහන් පරිදි) මගින්, සුනාමියෙන් විපතටපත් ප්‍රදේශවල ජල සම්පාදන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 3169 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ප්‍රදේශවල ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0195/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,—වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ගොවි ජනපදයට ජලය සපයන විලච්චිය වැව හා වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කරන ලද දිනය හා ගොවි ජනපදය පිහිටුවන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගොවි ජනපදයට ජලය සපයන අදාළ වැවේ ධාරිතාවය අක්කර අඩි කොපමණද;

(ii) එමගින් වගාකරන කුඹුරු ප්‍රමාණය කොපමණද;

(iii) විලච්චිය ව්‍යාපාරය යටතේ 2005, 2006 හා 2007 වර්ෂවල යල හා මහ කන්න සඳහා වගාකළ බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම වැවේ අබලන් වාරිමාර්ග පද්ධතිය හේතුවෙන් ගොවිබිම් වලට ප්‍රමාණවත් ජලය නොලැබෙන බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම වැවේ වාරිමාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0196/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,—වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ගොවි ජනපදයට ජලය සපයන කන්තලේ වැව හා වාරිමාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කරන ලද දිනය හා ගොවි ජනපදය පිහිටුවන ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ගොවි ජනපදයට ජලය සපයන අදාළ වැවේ ධාරිතාවය අක්කර අඩි කොපමණද;

(ii) එමගින් වගාකරන කුඹුරු ප්‍රමාණය කොපමණද;

(iii) කන්තලේ ව්‍යාපාරය යටතේ 2005, 2006 හා 2007 වර්ෂවල යල හා මහ කන්න සඳහා වගාකළ බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම වැවේ අබලන් වාරිමාර්ග පද්ධතිය හේතුවෙන් ගොවිබිම් වලට ප්‍රමාණවත් ජලය නොලැබෙන බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම වැවේ වාරිමාර්ග පද්ධතිය අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේනම්, එම අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2008 සැප්තැම්බර් මස 10 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0725/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සමෘද්ධි මුදල් වංචා කිරීම නිසා නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට සේවය අහිමි ව සිටින කළමනාකරුවන්, සංවර්ධන නිලධාරීන් හා වෙනත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ වංචාවලට සම්බන්ධ එම එක් එක් නිලධාරීන්ගේ නම් සහ වංචාකර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ මුදල් අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0726/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් නොවන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) පංතිවල හා උසස් පෙළ විද්‍යා, කලා හා වාණිජ විෂයයන් හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව පාසල් මට්ටමින් හා අධ්‍යාපන කලාප මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) පසුගිය වසර 10 තුළ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව පාසල් මට්ටමින් කොපමණද;

(ii) ඒ අතුරින් අදාළ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් නොවන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0727/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය ආරම්භයේ සිට 2007 වසර දක්වා අයවැය මගින් වෙන්කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එකී මුදලින් අධ්‍යාපන, සෞඛ්‍ය, මාර්ග හා විදුලිය යන අංශ සංවර්ධනය සඳහා යෙදවූ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය ආරම්භයේ සිට එක් එක් විදුලි ව්‍යාපෘතිය සඳහා වෙන්කළ මුදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0150/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂයේ අයවැය මගින්, සියලු පළාත්වල කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා රුපියල් මිලියන 1537 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) සිදු කරන ලද ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0151/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂයේ අයවැය මගින්, ප්‍රධාන නගර තුළ මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම සඳහා රුපියල් මිලියන 13,355 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) සිදු කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) ව්‍යාපෘති සිදුකළ ප්‍රධාන නගර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0152/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, ප්‍රධාන නගර තුළ මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම සඳහා රුපියල් මිලියන 17,040 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය සඳහා වෙන්කළ මුදල කොපමණද;

(ii) සිදු කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) ව්‍යාපෘති සිදුකළ ප්‍රධාන නගර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0009/'08

ගරු රවි කරුණානායක මහතා,—ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රටේ විශාල ආයෝජන සිදුවී ඇතැයි රජය කර ඇති ප්‍රකාශය අනුව, ආයෝජන මණ්ඩල පනතේ 16 හා 17 වැනි වගන්ති අනුව අත්සන් කළ ගිවිසුම්, ඒවා අත්සන් කරන ලද දිනයන්, එමගින් ජනනය කළ හැකි රැකියා ප්‍රමාණය, ඒවායේ ආයෝජන වටිනාකම හා එක් එක් ආයෝජනය අනුව, 2006 ජනවාරි මස 01 වැනි දින සිට අද දක්වා කාලය තුළ ඒවා ආරම්භ කිරීමට අපේක්ෂා කළ දිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) අනුව සැබෑ ආයෝජනය කොපමණද;

(ii) එමගින් රැකියා ජනනය සිදුකළ දිනය කවරේද;

(iii) එය පිහිටා ඇති ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත (අ) සහ (ආ) අනුව, රටේ අපනයන හැකියාව කෙරේ ඇතිවන ශුද්ධ බලපෑම එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0011/'08

ගරු රවි කරුණානායක මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා පුත්‍ර බැංකුව සංස්ථාගත කරන ලද්දේ කවදාද හා එහි ප්‍රාග්ධනය කොපමණද;

(ii) බැංකු නොවන ආයතන විසින් එහි මුදල් ආයෝජනය කර තිබේද;

(iii) එසේ නම්, සාමාන්‍ය කොටස් , වරණීය කොටස් හා ණයකර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආරම්භයේ සිට මේ දක්වා ගිණුම් කවරේද;

(v) එහි දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද; සහ

(vi) එහි ඉහළම නිලයන් දරන නිලධාරීන් 05 දෙනාගේ නම්, ඔවුන්ගේ වැටුප් හා ඔවුන්ට ලබා දී ඇති සියලුම වරප්‍රසාද මාසික පදනමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට පවතින පොලී අනුපාතිකයන්; සහ

(ii) ලබා දී ඇති ණය ප්‍රතිශතයන් ඒවායේ පොලී අනුපාතිකයන් සමගින්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0023/'08

ගරු රවි කරුණානායක මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007 ජනවාරි මස 12 වැනි දින ඉදිරිපත් කළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග තහවුරු කරන සාක්ෂි කවරේද;

(ii) පාර්ලිමේන්තුවට මීට පෙර ඉදිරිපත් කළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළ දිනය කවරේද;

(iii) එම වාර්තාවේ සඳහන් රාජ්‍ය ආයතනවලට එරෙහිව ගත් ක්‍රියාමාර්ග තහවුරු කිරීමේ සාක්ෂි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාවල සඳහන් වන පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග නොගැනීමට හේතුව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0349/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004/12/26 වැනි දින සිදුවූ සුනාමි ව්‍යසනයේ දී කහව, අකුරළ, 58/1 ලිපිනයෙහි පදිංචිව සිටි ආර්. එල්. එච්. හේමචන්ද්‍ර යන අයගේ බිරිඳ වන නාමල් රම්‍යලතා ද සිල්වා මහත්මිය හා ඇගේ මව මිය ගිය බවත්;

(ii) ඔවුන් පදිංචිව සිටි නිවසද විනාශ වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ජීවිතහානිය සහ නිවාස දේපල විනාශවීම සම්බන්ධයෙන් මොහුට මෙතෙක් කිසිම වන්දි මුදලක් ගෙවා නොමැත්තේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මොහුට අදාළ වන්දි මුදල ලබාදීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0350/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ, කිරුලපන, ඇලන් මැතිනියාරාම පූජා භූමියේ කොටසක් කවර හෝ පුද්ගලයෙකුට දේශපාලන කටයුතු කරගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමට අවසර දී තිබේද;

(ii) එසේ නැතහොත් බලහත්කාරයෙන් එම ඉඩම් අත්පත් කරගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඇලන් මැතිනියාරාමයේ වැඩ විසූ ස්වාමීන් වහන්සේට මෙම විහාරස්ථානයට ඇතුල්වීමට ඉඩ නොදී මැර කණ්ඩායමක් විසින් අවහිර කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) ගරු මහනායක ස්වාමීන් වහන්සේගේ අනුමතියකින් තොරව මෙම මැර කණ්ඩායම විසින් "විහාර කාර්යසාධක සමිතිය" නමින් සමිතියක් පිහිටුවා, ඒ මගින් දේශපාලන කටයුතු සඳහා මෙම විහාර භූමිය යොදගන්නා බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම විහාරස්ථාන භූමිය දේශපාලන කටයුතු වලින් නිදහස්කර දීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0351/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වලපනේ, නවනගරය, ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. පියසේන මහතා ලංකා ගමනා ගමන මණ්ඩලයේ වලපනේ ඩිපෝවේ සේවය කළ බවත්;

(ii) 2004/11/30 වැනි දින සිට ඔහු විශ්‍රාම ගන්වන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මොහුට හිමි පාරිතෝෂික මුදල් නොගෙවූයේ කවර හේතූන් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මොහුට අදාළ පාරිතෝෂික මුදල් ලබා දීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0470/'08

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0471/'08

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ මීගස්ආර ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2008 සැප්තැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0728/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) ඒවායේ ලිපිනයන් කවරේද;

(iii) එම සංවිධාන දැනට ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර 10 තුළ එක් එක් රාජ්‍ය නොවන සංවිධානය මගින් ක්‍රියාවට නංවනු ලැබූ ව්‍යාපෘති කවරේද;

(ii) ඒ සඳහා වෙන්කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එම රාජ්‍ය නොවන සංවිධානවල කටයුතු අධීක්ෂණය කිරීම සඳහා රාජ්‍ය ක්‍රියා පටිපාටියක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0729/'08

ගරු එන්.ඩී.එන්.පී. ජයසිංහ මහතා,—වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් විවිධ සේවා සමූපකාර සමිති කවරේද;

(ii) එම එක් එක් සමූපකාරය සතු චංචල හා නිශ්චල දේපළ කවරේද;

(iii) එම ආයතන මගින් පවත්වා ගෙන යනු ලබන ප්‍රාදේශිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ආයතනවල ඇති ණයබර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත එක් එක් ආයතනයට සමෘද්ධි ව්‍යාපාරය මගින් ලැබීමට ඇති හිඟ මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) මෙම ආයතන ගොඩනැඟීම සඳහා සමූපකාර අමාත්‍යාංශය මගින් වැඩපිළිවෙලක් සකස්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0730/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති ගොවිජන කේන්ද්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී ඇති වී, එළවළු, මල්, පළතුරු හා වෙනත් ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට රජයෙන් ලබාදෙන පොහොර සහනාධාරය ලබාදෙන්නේ කවර ගොවීන් සඳහාද;

(ii) ඒ සඳහා වාර්ෂිකව ලබාදෙන පොහොර ප්‍රමාණය සහ ඒ සඳහා වැයවන මුදල කොපමණද ,

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එළවළු ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබාදෙන්නේද,

(ii) එළවළු ගොවීන් සුරක්ෂිත කිරීම සඳහා අදාළ අමාත්‍යාංශය සතුව නව ක්‍රියාමාර්ග තිබේද,

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0153/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, සියලු පළාත්වල කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා රුපියල් මිලියන 2625 ක් වෙන්කර තිබු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) සිදු කරන ලද ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0154/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂයේ අයවැය මගින්, නිවාස සංවර්ධනය සඳහා සහායක වැඩසටහන් ලෙස රුපියල් මිලියන 450 ක් වෙන්කර තිබු බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් යොදවා සිදුකළ ව්‍යාපෘති කවරේද; සහ

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0155/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, සුනාමි සහායක වැඩසටහන් යටතේ රුපියල් මිලියන 118 ක් වෙන්කර තිබූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය සඳහා වියදම් කළ මුදල කොපමණද;

(ii) එම මුදල යොදවා සිදුකළ ව්‍යාපෘති කවරේද;

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0026/'08

ගරු රවි කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නොරොච්චෝලේ ව්‍යාපෘතිය සඳහා වන වියදම ආරම්භයේදී හා මේ වන විට කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදෙන රටේ හෝ ආයතනයේ නම කුමක්ද;

(ii) ණය ලබා දෙන කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) අවප්‍රමාණය වීමත් ඇතුළුව ඒකකයක් සඳහා වන පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0041/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 ජනවාරි මස 01 වැනි දින සිට මේ දක්වා අතිගරු ජනාධිපතිතුමා හෝ රජය විසින් පත් කරනු ලැබූ කොමිසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොමිසම් පිහිටුවීමේ අරමුණු සහ ඒවායේ වත්මන් තත්ත්වය කුමක්ද;

(iii) මෙම කොමිසම් පවත්වාගෙන යාම සඳහා මේ දක්වා දැරීමට සිදුව ඇති වියදම, එක් එක් කොමිසම අනුව කොපමණද; සහ

(iv) මෙම කොමිසම්වල ප්‍රධානත්වය දරන තැනැත්තන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කී කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද අතුරු වාර්තා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0045/'08

ගරු රවි කරුණානායක මහතා,— ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 වසර සහ 2007 වසර සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ලැබූ සම්පූර්ණ ලාභය කොපමණද;

(ii) ලීටරයක් අලෙවි කිරීම සඳහා වන සමස්ත පිරිවැයෙහි සංයුතිය කවරේද;

(iii) එකතුකර ඇති ලාභාන්තිකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කාලසීමාව තුළ අලෙවි කරන ලද පෙට්‍රල්, ඩීසල්, උඳුන් තෙල්, භූමිතෙල් හා ගුවන් යානා ඉන්ධන ලීටර් ප්‍රමාණය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කළ ප්‍රමාණයත්, ආනයනය කළ ප්‍රමාණයත්, එම ප්‍රමාණයන් සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය හා ලාභාන්තිකයන් සමග කවරේද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0352/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මහනුවර, අරුප්පල වත්ත පාර, අංක 23 ලිපිනයැති කේ. පී. බී. මුදන්නායක මහතා 1991.11.14 වැනි දින සිට ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ ආපන ශාලා පරීක්ෂකවරයෙකු ලෙස සේවයට බැඳී 1993.05.01 වැනි දින සිට රැකියාවේ ස්ථිර වූ බව එතුමා දන්නෙහිද?

(ආ) මහ බැංකු නවීකරණ ව්‍යාපෘතිය යටතේ මොහු, ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම සඳහා 2001.11.15 වැනි දින ඉල්ලා අස්වීමේ අයදුම්පත් භාරදුන් අතර, ඉන් දින 04කට පසුව එනම් 2001.11.19 වැනි දින නැවතත් එම අයදුම්පත ඉල්ලා අස්කර ගැනීම සඳහා වූ ලිපිය ආයතන ප්‍රධානියාට භාරදුන් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මුදන්නායක මහතාගේ ස්වේච්ඡා විශ්‍රාම යාම සඳහා ඉදිරිපත් කළ අයදුම්පත නැවත ඉල්ලා අස්කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීම නොපිළිගත්තේ කවර හේතුවක් නිසාද;

(ii) විශ්‍රාම යාම සඳහා අවශ්‍ය වසර 10ක සේවා කාලය සපුරා තිබියදීත්, මොහුගේ විශ්‍රාම වැටුප පවා අහිමිකර ඇත්තේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මොහුගේ සේවා කාලය දීර්ඝ කරදීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0354/’08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2003 වර්ෂයේ සිට බුද්ධ ශාසන අමාත්‍යාංශය (වත්මන් ආගමික කටයුතු අමාත්‍යාංශය) යටතේ ක්‍රියාත්මක කර ලද පුණ්‍යග්‍රාම ව්‍යාපෘතියේ උපදේශකවරයෙකු ලෙස කටයුතු කළ පූජ්‍ය බලපිටියේ සිරි සීවලී හිමියන් එම තනතුරින් ඉවත්කළේ කවර හේතුවක් නිසාද;

(ii) පුරා වසර හතරක් මුළුල්ලේ සෑම සති අන්තයකම දුෂ්කර ගම්මානයන්හි වැඩ සටහන් 300කට සහභාගිවී ඇති සීවලී හිමියන් ඉවත් කර ඒ වෙනුවට පත් කර ඇත්තේ කවුරුන්ද;

(iii) ඒ කවරෙකුගේ නිර්දේශයක් මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ පත්කර ඇති අයගේ අධ්‍යාපන හා ආගමික සුදුසුකම් කවරේද;

(ii) බලපිටියේ සිරි සීවලී හිමියන් නැවත ඉහත තනතුරට පත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0355/’08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පාදුක්ක, බෝපේ, උඩගම, අංක 52 ලිපිනයෙහි පදිංචි එස්. පී. ආරියරත්න නමැති අයෙකු විසින් බලපත්‍ර රහිතව භුක්ති විඳිනු ලබන ඉඩමේ කොස් ගස් 02ක් හා වල් දෙල් ගසක් කිසියම් අයෙකු විසින් හොර රහසේ කපාගෙන ගොස් ඇති බවත්;

(ii) ඒ පිළිබඳව 2007.01.06 වැනි දින පාදුක්ක පොලිසියට පැමිණිලි කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මොහුගේ මෙම පැමිණිල්ල විභාග කර නීතිමය පියවර නොගන්නේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අනවසරයෙන් මෙම දැව කපාගෙන ගිය අය කවුරුන්ද යන්න හෙළිකරගැනීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0472/’08

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0473/'08

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි, සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0474/'08

ගරු විජිත රණවීර මහතා,— පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති ''කඩවර'' යනුවෙන් හැඳින්වෙන තණබිමේ අයිතිය ඇත්තේ කවරෙකුටද;

(ii) එය ලියාපදිංචි කළ රාජ්‍ය ආයතනයට කිරි ගොවීන් විසින් 2005 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ගෙවා ඇති බදු මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම තණබිමේ භාරකාරත්වය ගවහිමි ගොවි සංවිධානයකට පවරා තිබේද;

(iv) ඒ කවර පදනමක් මතද;

(v) පැවරුම්කරු හා පැවරුම්ලාභීන් කවුරුන්ද;

(vi) එම සංවිධානයේ නම, එහි ප්‍රධාන තනතුරු දරන අයගේ නම් සහ ලිපිනයන් කවරරේද;

(vii) සාමාජික සංඛ්‍යාව හා එම සංවිධානයට තණබිම පැවරූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම තණබිම සංවර්ධනයට මෙතෙක් යොදවා ඇති රාජ්‍ය හෝ රාජ්‍ය නොවන මුදල් ප්‍රමාණය, එම සංවර්ධන කටයුතු අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තණබිම වටා විදුලි වැටක් ඉදිකිරීම, කටුබැද්ද ඉවත්කර තණකොල වැවීම හා දැනට ප්‍රයෝජනයට නොගන්නා වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුදල් වෙන් කරන්නේද;

(iii) ඒ කවර කාල රාමුවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ''කඩවර'' තණබිම පිළිබඳව අංග සම්පූර්ණ පසුබිම් වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0731/'08

ගරු එන්.ඩී.එන්.පී. ජයසිංහ මහතා,— වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් නගරය අසළ ඉදිකර ඇති ''තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය'' අදාළ අමාත්‍යාංශයට අයත්වේද;

(ii) එසේනම් එය ඉදිකරන ලද වර්ෂය කවරේද;

(iii) ඒ සඳහා වැයකර ඇති මුලු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ මධ්‍යස්ථානය ආරම්භයේ සිට මේ දක්වා තාක්ෂණික පුහුණුව සඳහා බඳවා ගෙන ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට අදාළ ආයතනය වසා දමා ඇත්තේ කවර හේතුවක් නිසාද;

(iii) එය විවෘත කිරීමට අදාළ අමාත්‍යාංශය මගින් කිසියම් හෝ ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'08

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හඟුරන්කෙත සමෘද්ධි බැංකු 10 මගින් "දියතිලක ඇපරල්" නමින් වන ඇඟලුම් කම්හල ආරම්භ කිරීමට ණය ලබාදී ඇති පිරිස කොපමණද;

(ii) එම ණයලාභීන්ගේ නම් හා ලබාගත් ණය මුදල කොපමණද;

(iii) අදාළ ඇඟලුම් කම්හලේ ආරම්භක නිලධාරීන් හා සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉදිකිරීම් හා යන්ත්‍ර මිළදී ගැනීම සඳහා වැයකර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ඇඟලුම් කම්හල පසුකාලයේ වෙනත් අයෙකුට විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේනම් එය විකුණා ඇත්තේ කවර මිළකටද;

(ii) විකුණා ලත් මුදල සමෘද්ධි බැංකු වලින් ගත් ණය පියවීම සඳහා යෙදවූයේද;

(iii) තවදුරටත් ගෙවීමට ඇති මුදල හා අදාළ ගෙවීම් අඛණ්ඩව සිදුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0156/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, නිවාස සංවර්ධනය සඳහා සහායක වැඩසටහන් ලෙස රුපියල් මිලියන 198 ක් වෙන්කර තිබූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් යොදවා සිදු කළ ව්‍යාපෘති කවරේද;

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0157/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 119 ක් තුළ එක් ගමකට ගෙවල් 25 බැගින් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 600 ක් වෙන්කර තිබූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂයේ ඒ සඳහා වියදම් කළ මුදල කොපමණද;

(ii) ව්‍යාපෘති සිදුකළ ගම් කවරේද;

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0158/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන්, ලුනාව පරිසර හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් 1,110,923,000 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය සඳහා වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර වැඩ කටයුතු සඳහා ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0048/'08

ගරු රවි කරුණානායක මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් (HDL) සමාගමට අයත් හිල්ටන් හෝටලය පිහිටා ඇති අක්කර 7කට වැඩි ඉඩම 1999 ජූලි මස විශේෂ ප්‍රදාන අංක 673 සහ 674 පවරාදීමට අනුව රජය වෙත පැවරී තිබෙන බව; හා

(ii) මෙම ඉඩම නැවත රජය වෙත පවරා තිබෙන බව;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1999 ජූලි මස සිට මෙම ඉඩම පරිහරණය වෙනුවෙන් HDL සමාගම විසින් ගෙවූ මුදල කොපමණද;

(ii) මුදල් ගෙවනු නොලැබුවේ නම්, එම පහසුකම සෙසු අයටත් ලබා දෙන්නේද;

(iii) HDL සමාගම බංකොලොත්වී ඇති බැවින් එය විසුරුවා හැරීම සඳහා අයදුම්පත්‍රයක් ගොනුකර තිබේද;

(iv) 2007 මැයි මස 03 වැනි දිනෙන් පසු HDL සමාගම විසුරුවා හැරීමට අමාත්‍ය මණ්ඩලය විරුද්ධ වී තිබේද;

(v) එසේ නම්, 2007 අංක 07 දරන සමාගම් පනත අනුව රජයේ ණය සඳහා වන හිඟය, ආපසු රජයට ගෙවීමේ වගකීම පුද්ගලිකව අමාත්‍ය මණ්ඩලය බාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0051/'08

ගරු රවි කරුණානායක මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2001 වසරේ සිට අද දක්වා රජය විසින් ලබා ගෙන ඇති දේශීය ණය සහ විදේශීය ණය වල සමස්ත වටිනාකම වාර්ෂිකව කොපමණද;

(ii) පොලි අනුපාතය සහ ආපසු ගෙවීමේ කාල සීමාව කොපමණද;

(iii) මෙකී ණය මුදල් ලබා ගැනීමේ හේතුව කවරේද;

(iv) අද දිනට පවතින, ජාතියේ දේශීය ණය සහ විදේශීය ණය වල සමස්ත වටිනාකම කොපමණද;

(v) මෙකී ණය මුදල් ආපසු ගෙවිය යුතු දිනය කවදාද;

(vi) ගෙවිය යුතු මුළු පොලිය සහ එකී පොලී මුදල ගෙවා දැමිය යුතු දිනයන් කවරේද; සහ

(vii) වසර 2001 සිට අද දක්වා පොළී පිරිවැය ප්‍රමාණය වාර්ෂිකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කළ පරිදි ආපසු ගෙවිය යුතු මුදල (මුල් මුදල සහ පොළී එකතුව) කොපමණද; සහ

(ii) වාර්ෂිකව ආපසු ගෙවිය යුතු සමස්ත මුදල කොපමණද;

යන්න පිළිබඳ කරුණු සියල්ල අඩංගු උපලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම ණය ආපසු ගෙවීම සිදුකිරීමට යන්නේ කුමන ඉපැයීම් තුළින්දැයි එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0062/'08

ගරු රවි කරුණානායක මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පාර්ලිමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තු තුළින් සම්මත නොකර ජාතික අයවැය දෙපාර්තමේන්තුව හරහා අරමුදල් ප්‍රතිපාදනය කිරීමට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට බලය ලබා දෙන 6 වැනි වගන්තියක් 2005 සහ 2006 විසර්ජන පනත්කෙටුම්පත් මගින් හඳුන්වා දෙනු ලැබූ බවත්;

(ii) ඒ මගින් රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය රහසිගතව අත් කර ගැනීමක් සහ හීන කිරීමක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත කී වගන්තියේ විධිවිධාන භාවිතා කරමින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2006 සහ 2007 වර්ෂවලදී ප්‍රතිපාදන කරන ලද මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න එතුමා මෙම සභාවට වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම මුදල් භාවිතා කරන ලද්දේ කවර කාර්යයක් සඳහාද;

(ii) එහි වැය ශීර්ෂ අංකය සහ විශේෂිත ව්‍යාපෘති කේතය අදාළ විස්තරයක් සමග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0356/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පිලිමතලාව, මොලදණ්ඩ, මැද්දේගොඩේ ගෙදර වත්ත, අංක 96/2 ලිපිනයෙහි පදිංචි එන්. වයි. විමලදාස මහතා 1960 වසරේ සිට උඩරට ගැමි කොමිෂන් සභාවේ කම්කරුවෙකු ලෙස සේවය කළ බවත්;

(ii) 1987 වසරේදී රෝලර් රියදුරෙකු වශයෙන් විශ්‍රාම ගන්වන ලද බවත්;

(iii) මොහුට විශ්‍රාම වැටුප හිමිව ඇත්තේ 1977 සිට 1987 දක්වා දස අවුරුදු සේවා කාලයකට පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මොහු මෙම ආයතනයේ සේවය කළ 1960 සිට 1977 අතර කාලසීමාවට අදාළව විශ්‍රාම වැටුප් ගණනය නොකළේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 1960 සිට 1987 දක්වා වන මොහුගේ අඛණ්ඩ සේවා කාලය සැලකිල්ලට ගෙන මොහුගේ සම්පූර්ණ විශ්‍රාම වැටුප ලබා දීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0357/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩවෙල ජනපද නිලධාරි කොට්ඨාසයේ බරවර්ධනඔය උප තැපැල් කාර්යාලය පිහිටි රජය සතු ඉඩමේ කොටසක් පෞද්ගලික අයෙකු අනවසරයෙන් වැටකඩොලු බැඳ භුක්ති විඳින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බරවර්ධනඔය එක්සත් සුභ සාධන හා මරණාධාර සමිති ශාලාවක් ඉදිකර ගැනීමට දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් මත මෙම ඉඩම ලබාගැනීමට කටයුතු කර ඇති බවත්;

(ii) ඒ සඳහා මෙම අනවසර භුක්තිය බාධාවක් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම ඉඩමේ අනවසර පදිංචිකරු ඉවත්කර බරවර්ධනඹය එක්සත් සුභ සාධක සමිතිය වෙත මෙම ඉඩම ලබා දීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0358/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හපුතලේ මැතිවරණ කොට්ඨාසයේ නිකපොත, බෙරගල, පහල බැලැක්වුඩ්ගම එස්. කේ. ආරියරත්න මහතා විසින් "මිරිදිය" නමින් විසිතුරු මත්ස්‍ය සහ මල් අලෙවිසැලක් පවත්වාගෙන ගිය අක්කර 2 1/2 ක් පමණ වූ ඉඩම හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් විසින් පවරාගෙන නැවත වෙනත් අයෙකුට පවරාදීමට කටයුතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අසාධාරණ ලෙස මෙම ඉඩම පවරාගෙන එහි ඉදිකර තිබූ ගොඩනැගිලි සහ විසිතුරු මත්ස්‍ය වගාව හා මල් වගාව විනාශ කර ඇති බවත්;

(ii) සංචාරක ව්‍යාපාරයක් කර ජීවත් වූ මොහු ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මොහුගේ ඉහත සංචාරක ව්‍යාපාරය නැවත කරගෙන යාම සඳහා මෙම ඉඩම ආපසු ලබාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0494/'08

ගරු විජිත හේරත් මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන කොපමණ සංඛ්‍යාවක් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබේද;

(ii) එම වාහනවල වර්ගය, අංකය සහ මුදාහල දිනය කවරේද;

(iii) කවර ආයතනයක් හෝ පුද්ගලයන් වෙත කවර පදනමක් මත මුදාහැර තිබේද;

(iv) අනුයුක්ත කිරීමක් සිදුකර තිබේනම් ඔවුන්ගේ නම හා තනතුර කවරේද;

(v) එම වාහන මුදාහැරීමට නිසි අනුමතියක් ලබා තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි බදු හෝ කුලී පදනමින් බාහිර පාර්ශ්වයන් වෙත ලබා දී තිබේද;

(ii) එකී ගොඩනැගිලි පිහිටි ස්ථානයන්හි ලිපිනය සහ අදාළ බදු හෝ කුලී පදනම කවරේද;

(iii) ලබා දී ඇති ආයතන හෝ පුද්ගලයින්ගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0495/'08

ගරු විජිත හේරත් මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ඇති පරිපාලිත සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සමාගම පිහිටුවීමේ අරමුණ කවරේද;

(iii) එම එක් එක් පරිපාලිත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ නම, තනතුර, වැටුප් සහ බඳවාගත් පදනම කවරේද;

(iv) එම සමාගම් වෙත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ලබා දී ඇති විවිධාකාර මූල්‍ය පහසුකම්, වාහන, යන්ත්‍ර, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පරිපාලිත සමාගම් වලින් අපේක්ෂිත අරමුණු ඉටුවන්නේද; සහ

(ii) එම සමාගම්, වාර්ෂික ගිණුම් විධිමත් පරිදි පවත්වා ගනිමින් යහපත් මූල්‍ය විනයක් පවත්වාගෙන යන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0496/'08

ගරු විජිත හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යංශයේ (මධ්‍යම නැව් ගාස්තු කාර්යාංශයේ) නාවික සංවර්ධන අරමුදල සඳහා විවිධ නැව් නියෝජිතයන්ගේ කොමිස් මුදල් වශයෙන් අයවිය යුතු, එහෙත් 2002 වර්ෂයේ සිට මේ දක්වා හිඟ ව පවතින මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මුදල් අයවිය යුතු ව තිබෙන නැව් නියෝජිතයින්ගේ නම, ලිපිනය සහ අදාළ මුදල කොපමණද යන්න සවිස්තරව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නාවික සංවර්ධන අරමුදල සතු මුදල්, පෙර වර්ෂ වලදී රජයේ හෝ වෙනත් සංවිධාන වෙත මාරුකර තිබුණේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම් එම මුදල, අදාළ දිනයන් සහ ඒ කවර පදනමක් මතද යන්න එම සංවිධානවල නමට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0518/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සේවා ලබාදීමේ දී අවශ්‍ය වන විදුලි මීටර්වල හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි විදුලි මීටර් හිඟයක් ඇතිවීමට හේතු කවරේද;

(ii) එම විදුලි මීටර් හිඟය ආරම්භ වූයේ කවර වසරක සිටද;

(iii) මේ නිසා විදුලිය ලබාගැනීමට සිටින පාරිභෝගිකයිනට සිදුවන අපහසුතාවයන් මඟහැරීමට ගනුලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය වෙත විදුලි මීටර් ආනයනය කරන සමාගම් හා රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත ප්‍රතිපාදන වලින් ලබාදෙන විදුලි යෝජනා ක්‍රම විවෘත කිරීමේදී ද මෙම මීටර් හිඟය හේතුවෙන් අදාළ විවෘත කිරීම් ප්‍රමාද කිරීමට සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම ප්‍රමාද කිරීම් වැළැක්වීමට අදාළ අමාත්‍යාංශ මට්ටමින් ගතහැකි ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0159/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නගර සංවර්ධනය සඳහා රුපියල් මිලියන 889 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0160/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, ප්‍රජා ජල සම්පාදනය සඳහා රුපියල් මිලියන 1940 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0161/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, ඉඩම් ගොඩ කිරීමේ මණ්ඩලය යටතේ ඇල මාර්ග පුනරුත්ථාපනය හා නඩත්තුව සඳහා රුපියල් මිලියන 72 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 සැප්තැම්බර් මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0162/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින් , ලුනාව පරිසර හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1230 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර වැඩ කටයුතු සඳහා ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0163/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින් , ජාතික භෞතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ පූජාභූමි සංවර්ධනය සඳහා රුපියල් මිලියන 274 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර ව්‍යාපෘති සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0164/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ පාරිභෝගික නිලධාරී තනතුර සඳහා 2007.01.11 දින දෙවැනි සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණයට කැඳවූ සංඛ්‍යාව හා 2007.01.11 දිනට පැවති තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) තනතුරු සංඛ්‍යාව වැඩිකිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටියේ නම් අදාළ සංඛ්‍යාව හා දිනය කවරේද;

(iii) 2007.01.11 දින සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අයගේ නම, ලිපිනය, ලබාගත් ලකුණු වෙන් වෙන්ව කවරේද;

(iv) දෙවැනි සම්මුඛ පරීක්ෂණයේ දී කුසලතා පදනමින් තෝරාගත් අයට පත්වීම් ලබානොදීමට හේතුව කවරේද;

(v) මැයි මස 07 දින තවත් දෙවැනි සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට හේතුව කවරේද;

(vi) මේ සඳහා 2007.01.11 දින නොකැඳවූ අය කැඳවා තිබේනම් ඊට හේතුව කවරේද;

(vii) ඔවුන්ගේ නම, ලිපිනය සහ ලබාගත් ලකුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2007.01.11 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී 5 වන ස්ථානයට පසුපසින් සිටි සංචාරක මණ්ඩලයේ ජාතික සේවක සංගමයේ හිටපු සභාපතිවරයාගේ දියණිය එම්. එන්. ද අල්විස් යන අය 2007.05.07 දින සම්මුඛ පරීක්ෂණයෙන් ඉදිරියට ගෙන පත්වීම් ලබාදී ඇති බවත්;

(ii) මෙහිදී ජයප්‍රියා ආදිහෙට්ටි යන අය ඉවත්කිරීම මගින් සුදුසුකම් ලැබූ අයට අසාධාරණයක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම තත්වය නිවැරදි කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0165/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පිළියන්දල, කහපොල, රෙජිඩෙල්වත්ත විකිණීම හා සම්බන්ධව මෙන්ම, සමරකෝන් බූදලයට අදාළව සිදු වී ඇති අකටයුතු පිළිබඳවත්, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පොදු දේපල පිළිබඳ විවිධ දූෂණ සම්බන්ධවත් 2006 වසරේ මූලික විමර්ශන වාර්තාවක් නිකුත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති එකී වාර්තාව අනුව, චෝදනා ලැබුවන් සම්බන්ධයෙන් හා සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0166/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පිළියන්දල රෙජිඩේල්වත්ත ඉඩම, ආයෝජන මණ්ඩල අනුමැති ව්‍යාපෘතියක් ලෙස මිලේනියම් සිටි නිවාස ව්‍යාපෘතියක් සඳහා සෙලින්කෝ ඩිවලපර්ස් ආයතනයට ලබා දී තිබූ බවත්;

(ii) එකී ව්‍යාපෘතියට මෙම ඉඩම විකිණීම නීති විරෝධී මෙන්ම පරිසර හානියක්ද සිදුවෙන බව සඳහන් කරමින් ජනතා විරෝධයක් පැන නැගුන බවත්;

(iii) ඒ අනුව ඉහත නිවාස ව්‍යාපෘතිය අවලංගුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස ව්‍යාපෘතිය අවලංගු කිරීමෙන් පසු, මෙම ඉඩම පිළිබඳව කටයුතු කර ඇත්තේ කවර ආකාරයකටද;

(ii) ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණය කොපමණද;

(iii) ඉඩම පිළිබඳව තිබෙන සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?